## හින්දු සංස්කෘතික අරමුදල - 2012

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට හින්දු සංස්කෘතික අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

කෝවිලකට අයත් ස්ථාවර තැන්පතුවලින්, 2011 වර්ෂයට අදාලව ලැබී තිබූ රු. 173,959 ක පොළ ආදායම මෙම අරමුදලෙහි ආදයමක් ලෙස ගිණුම් ගතවීම, සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමේදී පූර්ව වර්ෂ ගැලපුම් ගිණුම හර කර්ම වෙනුවට වර්ෂයේ ආදයම් හා වියදම් ගිණුමට හර කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**1.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනකුල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්. 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ | |
| 4.1 (ඇ) ඡේදය | අනුමත අයවැය ලේඛනයකින් තොරව වර්ෂයේ වියදම් සිදුකර තිබුණි. |
| 4.2 ඡේදය | අරමුදල විසින් නිවැරදි ගිණුම් පොත් පත් හා ලේඛන නඩත්තු කරමින් සතුටුදායක ගිණම් ක්‍රමයක් පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු. 1,623,544 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,298,301 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 325,243 ක වර්ධනය කෙරෙහි වෙනත් ආදායම් රු. 1,434,071 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

(අ) 2012 වර්ෂයේ අරමුදලෙහි ක්‍රියාකාර සැලැස්මට අනුව කාර්ය සාධනය

මූල්‍ය ප්‍රකාශනය අනුව 2011 වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රගතියක් නිරූපනය වී තිබුණත් භෞතික කාර්යය සාධනය දුර්වල තත්ත්වයක පැවතුණ. ක්‍රියාකාර සැලැස්මට අනුව රු. මිලියන 4 ක ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනයක් මත වැඩසටහන් 03 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණත් ඉන් එක් වැඩසටහනක් මුළුමණන්ම ක්‍රියාත්මක කර නොතිබුණි. තවත් එක් වැඩසටහනක මූල්‍ය ප්‍රගතිය සයයට 40 ක් වී තිබුණු අතර අනෙක් වැඩසටහන සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කර තිබුණ. මෙම වැඩසටහන්වල භෞතික ඉලක්කයන් දක්වා නොතිබණු බැවින් ඒ පිළිබඳ ඇගයීමක් කළ නොහැකි විය.

(ආ) අරමුදලෙහි සමස්ථ කාර්ය සාධනය

හින්දු සංසකෘතික අරමුදලෙහි අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය අරමුදල් දේශියව හෝ විදේශයව එක්රැස් කිරීමේ නෛතික ප්‍රතිපාදන හින්දු සංස්කෘතික අරමුදල් පනතෙහි 7 වන වගන්තිය ප්‍රකාරව සලසා දී තිබුණි. එම නෛතික ප්‍රතිපාදන උපයෝග කරගෙන, සංවර්ධනය කළයුතු හින්දු පූජනීය ස්ථාන සංවර්ධනය කිරීම හා හින්දු ආගම් හා සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළ හැකි වුවත්, අරමුදල් පාලක මණ්ඩලය විසින් ඒ පිළිබඳ නිසි අවධානයක් යොමු කර නොතිබුණි. අරමුදලේ 2012 වර්ෂයේ මුළු ලැබීම් වලින් සියයට 52 ක්ම සමන්විතව තිබුණේ එහි අරමුදල හා පරමාර්ථ ඉටුකිරීමෙන් තොරව නිශ්ක්‍රීයව පැවති අරමුදල් ආයෝජනයෙන් වන ප්‍රතිලාභ වලිනි. එමෙන්ම වර්ෂය තුළ කෝවිලක අරමුදලින් පරිත්‍යාග කරන ලද රු. 1,200,000 ක මුදල වැය කිරීමට අදාල නිශ්චිත වැඩ පිළිවෙලක්ද නොතිබුණ බැවින් එම මුදල්ද නිශ්ක්‍රීයව පැවතුණි.

### 3.2 ආර්ථික නොවූ ගනුදෙනු

**දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් මිලදී ගැනීම**

සමාලෝචිත වසර තුළ අවස්ථා 02 කදී එකතුව රු. 950,000 ක් වැය කරමින් දහම් පාසල් ගුරුවරුන්ට බෙදාහැරීම සඳහා නිලඇඳුම් මිලදී ගෙන තිබූ අතර මිලදී ගත යුතු සාර්වලට අදාල පිරිවිතරයක් සකස් කර නොතිබුණ අතර සැපයුම්කරු තෝරා ගැනීමේදී සාර්වල ගුණත්වය පිළිබඳ සැලකිල්ලක් දක්වා නොතිබුණි. තවද ප්‍රසම්පාදන ක්‍රියාවලියේ වූ අඩු පාඩු හේතු කොට ගෙන රු. 50,000 ක පාඩුවක් අරමුදලට දැරීමට සිදුවී තිබුණි.

### 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

**ක්‍රියාකාර සැලැස්ම**

2003 ජුනි 02 දිනැති අංක පී.ඊ.ඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 පරිච්ඡේදයේ දී ඇති උපදෙස්වලට අනුව සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණු අතර ඊට අදාලව, 1985 අංක 31 දරන හින්දු සංස්කෘතික අරමුදල් පනතෙහි විස්තර කර ඇති පරිදි එහි අරමුණ හා පරමාර්ථ ඉටුකර ගැනීමට හැකිවන පරිදි, විධිමත් ක්‍රියාකාර සැලැස්මක්ද සකස් කර නොතිබුණ.

### 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින්වර අරමුදලේ සභාපතිවරයා දැනුවත් කරන ලද අතර පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ප්‍රසම්පාදනය